නිපුණතාවය :- 5.මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරය

නිපුණතා මට්ටම :- 5. 10 . ගනුදෙනු මූලික පොත් වල සටහන් කිරීමේ දී සහ ලෙජරය ට පිටපත් කිරීමේ දී සිදුවූ වැරදි නිවැරදි කරයි .

ඔබගේ පෙළ පොතේ පිටු අංක 158 සිට 162 **දක්වා හොඳින් කියවන්න.**

- පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සොයා ගැනීමට උනන්දු වන්න.
  01. ගිණුම්කරණ වැරදි නිවැරදි කල යුත්තේ ඇයි ?
  02. ගිණුම්කරණ වැරදි සිදුවිය හැකි අවස්ථා හතරක් නම් කරන්න .
  03. ශේෂ පිරික්සුම ක් හර සහ බැර තීරුවල එකතු වටිනාකම සමාන වීමෙන් තහවුරු වන්නේ කුමක් ද ?
  04. ගිණුම්කරණ වැරදි කොටස් දෙකකට බෙදිය හැකි ය . ඒවා නම් කරන්න .
  05. ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමට අදාල මූලික පොත කුමක්ද ?
  06. ශේෂ පිරික්සුමෙන් හෙළිදරව් නොවන වැරදි සඳහා නිදසුන් හතරක් ලියන්න .

ව්‍යාපාරයක ගනුදෙනු ගිණුම් ගත කිරීමේ දී සිදුවී ඇති පහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන් ලියන්න .

* . රු .100,000 ක් විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත් වල සටහන් කිරීම සම්පූර්ණයෙන්ම මගහැරී ඇත .

* . රු. 40,000 ක්වූ ණයට ගැණුම් ඉන්වොයිසියක රු. 4,000 ක් ලෙස ගැණුම් ජ'නලයේ සටහන් වීම .

* . ණය ගැතියෙකුට ලබා දුන් රු.2,500 දුන් වට්ටම මුදල් පොතේ දුන් වට්ටම් තීරුවේ රු. 5,200 ක් ලෙස සටහන් වී තිබීම .

* . රු. 20,000 ක් සේවක වැටුප් ගෙවීම අදාල ගිණුම් වල දෙවරක් සටහන් වීම .

* . ව්යාපාරයේ ගොඩනැගිලි අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවූ රු. 150,000 ගොඩනැගිලි ගිණුමට හර කර තිබීම .

අභ්‍යාස .

ඔබගේ පෙළ පොතේ පිටු අංක 162 හි සඳහන් ක්‍රියාකාරකම 01 සහ 02 සඳහා පිළිතුරු සපයන්න .